# ජනාධිපති කාර්ය සාධන බලකා දෙකක් පත් කිරීම

සාකච්ඡාව සඳහා වූ පත්‍රිකාව

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

2020 ජූනි

CPA

Centre for Policy Alternatives

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

විකල්ප ප්‍රතිපත්ති කෙන්ද්‍රය යනු ස්වාධීන දේශපාලන පක්ෂවාදීත්වයෙන් තොර සංවිධානයක් වන අතර එය මූලික වශයෙන් රාජ්‍යකරණය සහ ගැටුම් නිරාකරණය හා සබැඳි ගැටෑ කෙරේ සිය අවධානය යොමු කරයි.1996 වර්ෂයේ දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිටවනු ලැබුයේ මහජන ප්‍රතිපත්තීන් පිළිබඳව වූ කතිකාවත සඳහා සිවිල් සමාජයේ සජීවී දායකත්වය අත්‍යවශ්‍ය වන බවට හා එය ශක්තිමත් කළ යුතුව පවතින බවට දැඩි විශ්වාසය පෙරදැරි කොටගෙනය.මහජන ප්‍රතිපත්තීන් විවේචනාත්මක විමර්ශනයට භාජන කරන"විකල්පයන් හඳුනා ගන්නා හා ඒවා ව්‍යාප්ත කරන පර්යේෂණ හා බලපෑම් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කැපවී සිටී.

6/5, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 5 ශ්‍රී ලංකාව

දුරකතනː + 9411 2081384 + 94112081385 + 94112081386

ෆැක්ස්ː + 94112081388 විද්‍යුත් තැපැල. info@cpalanka.org

වෙබ් අඩවියː www.cpalanka.org

විද්‍යුත් තැපැලː info@cpalanka.org

මුහුණු පොතː www.facebook.com/cpasl

ට්විටර්ː @cpasl

## පටුන


1. හැඳින්වීම

2. මේ ආකාරයේ කාර්ය සාධන බලකා පිහිටුවීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වැනි ව්‍යවස්ථාව යොදා ගැනීම

3. කාර්ය සාධන බලකාය සතු අධිකාරිය

4. 2020 ජුනි මස 2 වැනි දින පිහිටුවන ලද බලකා දෙක පිළිබඳ වූ විශේෂිත කරුණු

අ. සුරක්ෂිත රටක්, විනයගරුක, ගුණ ගරුක සහ නීති ගරුක සමාජයක් ගොඩ නැගීමේ ජනාධිපති කාර්ය සාධක බලකාය

i කාර්ය සාධන බලකායේ අරමුණ

ii කාර්ය සාධන බලකායේ සංයුතිය

iii කාර්ය සාධන බලකායේ බලතල

ආ. නැගෙනහිර පළාතේ පුරාවිද්‍යාත්මක උරුමයන් කළමනාකරණය සඳහා වූ ජනාධිපති කාර්ය සාධක බලකාය

i පසුබිම

ii කාර්ය සාධන බලකායේ සංයුතිය

iii කාර්ය සාධන බලකායේ අධිකාරී බලය

5. නිගමන

# 1. හැඳින්වීම

2020 වසරේ දී ශ්‍රී ලංකාවේ ජනාධිපති කාර්ය සාධන බලකා ගණනාවක් පත් කෙරිණ. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් කොවිඩ්-19 තත්වයට ප්‍රතිචාරයක් වශයෙන් ද දරිද්‍රතාවය මැඩලීම සඳහා ද තවත් එකක් අධ්‍යාපන කටයුතු පිළිබඳව ද ජනාධිපති කාර්ය සාධක බලකා[1] පත් කරන ලදී. වඩාත් මෑතක දී පිහිටුවන ලද්දේ සුරක්ෂිත රටක්, විනයගරුක, ගුණ ගරුක සහ නීති ගරුක සමාජයක් ගොඩ නැගීමේ ජනාධිපති කාර්ය සාධක බලකාය (අංක 2178/18 අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් පිහිටුවන ලද) සහ නැගෙනහිර පළාතේ පුරාවිද්‍යාත්මක උරුමයන් කළමනාකරණය සඳහා වූ ජනාධිපති කාර්ය සාධක බලකාය ( අංක 2178/18 අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් පිහිටුවන ලද) යන කාර්ය සාධක බලකායන් ය. එකී බලකායන් ද්විත්වයම පිහිටුවන ලද්දේ 2020 ජුනි 2 වැනි දිනය.

මෙම කාර්ය සාධක දෙක පිහිටුවන ලද්දේ පාර්ලිමේන්තුව මාස තුනකට වැඩි කාලයක් ක්‍රියාත්මක නොවී තිබිය දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අනිවාර්ය ප්‍රතිපාදනවලට පටහැනිව ය.[2] කාර්ය සාධන බලකා දෙක පත් කිරීමේ ගැසට් පත්‍ර නිකුත් වූයේ මාස තුනකට වැඩි කාලයක් පාර්ලිමේන්තුව විසුරුවා හැරීම සහ නිදහස් සහ සාධාරණ මැතිවරණයක් පැවැත්වීම පිළිබඳව ඉදිරිපත් කළ සියලු පෙත්සම් විභාගයට ගැනීම ප්‍රතික්ෂේප කරමින් ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීන්දුවක් ලබා දුන් වහාම බව විශේෂයෙන් සැලකිය යුතුය.[3] පාර්ලිමේන්තුව නොමැති වීමෙන් විධායක පියවර ගැන ව්‍යවස්ථාදායක අධීක්ෂණයක් නොමැති නිසා මෙම බලකායන්ගේ වගවීම සහ පාරදෘශ්‍ය භාවය පිළිබඳව ගැටලු ඇති කරවයි. තව දුරටත් 2020 පත් කළ අනෙක් ඒවායේ මෙන්ම මෙම බලකා දෙකේහි ද සංයුතිය වන්නේ හිටපු සහ දැනට සේවයේ යෙදී සිටින හමුදා නිලධාරීන්, නීතිය සහ සාමය රැකීම පිළිබඳ නිලධාරීන් සහ වෙනත් පුද්ගලයන් ය. ඉන් ආණ්ඩුව සහ පාලනය තන්ත්‍රය ක්‍රමයෙන් හමුදාකරණයවීම පිළිබඳ කණස්සල්ලක් ඇති කරවයි. අධීක්ෂණය, ප්‍රබල සංවරණ සහ තුලන ක්‍රමයක් නොමැතිවීම සහ හමුදා නිලධාරීන් කෙරේ වැඩි විශ්වාසයක් රැඳවීම, ජනාධිපති රාජපක්ෂ ශ්‍රී ලංකාව පාලනයේ කිරීමේ දී කාර්ය සාධක බලකා කෙරේ විශ්වාසයත් තැබීම සහ එහි බලපෑම් තවදුරටත් අධ්‍යයනය කළ යුතුය. මෙම මුලපිරුම් ගොඩ නැගී ඇත්තේ ජනාධිපති රාජපක්ෂ සිය මැතිවරණ ව්‍යාපාරයේ දී විනය, ස්ථාවරත්වය සහ ආරක්ෂාවට ප්‍රමුඛතාවය දීමේ

---

[1] දරිද්‍රතාවය තුරන් කිරීමට සහ ජීවනෝපායන් සංවර්ධනය කිරීමට පිහිටුවන කාර්ය සාධක බලකාය. 2020 ජනවාරි 25 දින අංක 2159/64 අති විශේෂ ගැසට් පත්‍රය.
සමස්ත ප්‍රජා ජන ජීවිතය පවත්වා ගැනීමේ අඛණ්ඩව සේවාවන් සැපයීම මෙහෙයවීම, සම්බන්ධීකරණය සහ අධීක්ෂණය කිරීමේ ජනාධිපති කාර්ය සාධක බලකාය 2020 මාර්තු 26 දින අංක 2168/8 අති විශේෂ ගැසට් පත්‍රය
http://documents.gov.lk/files/egz/2020/3/2168-08.E.pdf
ආර්ථික පුනර්ජීවනය සහ දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වූ කාර්ය සාධක බලකාය 2020 අප්‍රේල් 22 දින අංක 2172/9 අති විශේෂ ගැසට් පත්‍රය
http://documents.gov.lk/files/egz/2020/4/2172-09E.pdf
ත්‍රිවිධ හමුදා සාමාජිකයන් අතර කොරෝනා වයිරසය පැතිර යෑම වැළැක්වීමට සියලුම සන්නද්ධ බලකා විසින් ගත යුතු පියවර පිළිබඳව අධ්‍යයනය කිරීම සහ උපදෙස් ලබා දීමේ කාර්ය සාධන බලකාය
අප්‍රේල් 27 දින අංක 2173/4අති විශේෂ ගැසට් පත්‍රය
http://documents.gov.lk/files/2020/4/2173-04 E/pdf
ශ්‍රී ලංකාවේ අධ්‍යාපන කටයුතු පිළිබඳ කාර්ය සාධක බලකාය 2020 අප්‍රේල් 28 දින අංක2173/7 අති විශේෂ ගැසට් පත්‍රය
http://documents.gov.lk/files/egz/2020/4/2173-07Epdf

[2] ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70(5) (අ) ව්‍යවස්ථාවේ මෙසේ සඳහන් වේ: පාර්ලිමේන්තුව විසුරුවා හරින ප්‍රකාශනයෙහි "අභිනව පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරයන් තෝරාපත් කර ගන්නා දිනය හෝ දින නියම කොට තිබිය යුත්තේ ය.එකී ප්‍රකාශනය නිකුත් කළ දින සිට මාස තුනක් ගත වන්නට පෙර දිනයක දී අභිනව පාර්ලිමේන්තුවේ පළමුවන රැස්වීම ඒ ප්‍රකාශනයෙන්ම කැඳවිය යුත්තේ ය ' සම්බන්දන් එදිරිව නිතිපති (විසුරුවා හැරීමේ තීන්දුව) 2018 SCFR 351/2018 නඩුවේ දී ''.... 70 (2) (3) (5) සහ (7) ව්‍යවස්ථා පාර්ලිමේන්තුව කැඳවීම පිළිබඳ ජනාධිපතිවරයාගේ බලතල මත විශේෂිත අවශ්‍යතා පැනවෙන අතර ජනාධිපතිවරයා නිශ්චිත කාල සීමාවක් ඇතුළත පාර්ලිමේන්තුව කැඳවීමේ අවශ්‍යතාවය දැක්වෙන බව ශ්‍රේෂ්ඨාධිකරණය පිළිගත්තේය. (පිටුව 71) නඩු තීන්දුව: http://www.supremecourt'lk/images/documents/sc.fr.351.2018.pdf

[3] ශ්‍රේෂ්ඨාධිකරණය මූලික අයිතිවාසිකම් පෙත්සම් ඉවත දමයි. Daily News 2nd June 2020,
https://www.dailynews.lk/2020/06/02/law-order/219880/supreme-court-dimisses-fr-petitions

පොරොන්දු අනුව බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සටහන් කරයි. කෙසේ වුවත් මෙම පියවර නිදහස් සහ විවෘත සමාජය සහ ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය කෙරේ බරපතල බලපෑම් ඇති කරවයි.[4]

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මෙම කාර්ය සාධන බලකා දෙකත්[5] කොවිඩ් 19ට ප්‍රතිචාර වශයෙන් පත් කළ කාර්ය සාධන බලකායන් ගේ අවශ්‍යතාවය සහනීත්‍යානුකූල භාවයත්[6] ප්‍රශ්න කරමින් සිය මූලික අවධානය මතු කළේය. කෙටියෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මෙම සාකච්ඡාව සඳහා වූ පත්‍රිකාවෙන් ජුනි 2 පත් කරන ලද කාර්ය සාධක බලකා දෙකේ නිත්‍යානුකූල භාවයත් ඒවා පිහිට වූ ආකාරයත් ඒවායේ බලපෑම් පිළිබඳවත් පරීක්ෂා කරයි. මේවායේ සංයුතිය, ඒවාට පැවරී ඇති බලය ඉක්මවා යෑම, නීතියේ ආධිපත්‍යය, ව්‍යවස්ථානුකූල ප්‍රජාතන්ත්‍රවාදය සහ ශ්‍රී ලංකාවේ ප්‍රතිසන්ධානය කෙරේ ඇති කෙරෙන බලපෑම් මතු කරන ලද අනෙකුත් අවධානයන් ය. මෙම පත්‍රිකාව සකස්වී ඇත්තේ කාර්ය සාධක බලකා දෙකටම අදාලව මතු කළ නෛතික සහ පුළුල් අවධානයන් කෙරේ යොමුවන ආකාරයෙනි. ඉන් පසුව එක් එක් කාර්ය සාධන බලකායේ අධිකාරී බලයය සහ ඒ සම්බන්ධව පවත්නා ගැටලු පරීක්ෂාවට ලක් කෙරේ.

## 2. මේ ආකාරයේ කාර්ය සාධක බලකා පිහිටුවීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වැනි ව්‍යවස්ථාව යොදා ගැනීම

මේ ආකාරයේ ජනාධිපති කාර්ය සාධක බලකා පිහිටුවීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 ව්‍යවස්ථාව යොදා ගැනීම සම්බන්ධයෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මීට පෙර ද සිය කණස්සල්ල මතු කර ඇත.[7] මෙම ගැසට් පත්‍ර එකකින් හෝ 33 වගන්තිය යටතේ ඇති කුමන අනු ව්‍යවස්ථාව මෙම කාර්ය සඳහා යොදා ගෙන ඇත්දැයි නිශ්චිතව සඳහන් කර නැති නිසා ඒ යටතේ ජනාධිපතිවරයාට ලබා දී ඇති අනෙකුත් සියලු බලතල ස්වභාවයෙන් ඉතාමත් නිශ්චිත ය. එමනිසා මෙම කාර්ය සඳහා 33(2)(උ!) ව්‍යවස්ථාව යොදා ගෙන ඇතැයි සාධාරණව අනුමානය කළ හැකිය. එම ව්‍යවස්ථාව මෙසේ සඳහන් කරයිඃ

> (2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හෝ වෙනත් ලිඛිත නීතියකින් ජනාධිපතිවරයා වෙත පවරා ඇති හෝ නියම කර ඇත්තා වූ බලතලවලට සහ කාර්යයන්ට අමතරව"ජනාධිපතිවරයාට
>
> > (උ!) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක හෝ විධිවිධානවලට පටහැනි නොවන්නා වූ ද ජාත්‍යන්තර නීතිය"චාරිත්‍ර හෝ භාවිතය අනුව ඉටු කිරීමට ජනාධිපතිවරයාට බලය ලැබී ඇත්තා වූ හෝ නියමිතව ඇත්තා වූ සියලු ක්‍රියා හා දේ කිරීමට බලය ඇත්තේ ය.

කාර්ය සාධක බලකා පිහිටුවීමට මෙම ව්‍යවස්ථාව යොදා ගැනීම සම්බන්ධයෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ප්‍රධාන ගැටලු දෙකක් ඉදිරිපත් කරයි. එනම්,

---

[4] ශ්‍රී ලංකාවේ වත්මක් දේශපාලන අභියෝග සහ අනාගත බලාපොරොත්තු, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය 2020 මාර්තු https://www.cpalanka.org/wp-content/uploads/2020/03/Commentary-Sri-Lanka%E2%80%99s-Recent-Political-Challemges-Prospects-for-the-Future-pdf

[5] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය 2020 ජුනි 5 ජනාධිපති කාර්ය සාධන බලකා දෙකක් පත් කිරීම පිළිබඳව ප්‍රකාශයක් නිකුත් කෙළේය. https;//www.cplanka.org.the-appointment-of-two-presidential-task-forces/

[6] 2020 අප්‍රේල් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, ශ්‍රී ලංකාවේ කොවිඩ් 19ට මුහුණ දීමේ ව්‍යුහයන්ඃ ජනාධිපති කාර්ය සාධන බලකා පිළිබඳ කෙටි අදහසක් https://www.cplanka.org/wp-content/uploads/2020/04/FINAL-Presidential-Task-Force-on Covid19-April-2020-copy.pdf.

[7] ibid

33(2)(උ!) ව්‍යවස්ථාවේ අරමුණ වන්නේ සම්ප්‍රදායික අන්තර්ජාතික සහ ජුස් කොජෙන්ස් ( Jus cogens හෙවත් ජුස් කොජෙන්ස් යනු ජාත්‍යන්තර ගිවිසුමකින් එය වෙනස්කිරීම් සඳහා ඉඩ තබා නැත්නම් හා පිළිගත් නීති සහ සිරිත් වවින් බැහැර වුවහොත් එය බලරහිත වන බවයි) යටතේ රාජ්‍ය නායකයන්ගේ ක්‍රියාවන්ට අදාලව සහ දේශීය නීතිය ( MunicipalLaw ) හා පටහැනි නොවන ක්‍රියා යටතේ කළ හැකි කුමක්ද යන්න සීමා කිරීමේ ප්‍රයත්නයකි. මෙම ව්‍යවස්ථාවෙන් ඇත්තෙන්ම ජනාධිපතිවරයාට මණ්ඩල පිහිටුවීමට සහ මෙම කාර්ය සාධන බලකාවලට ලබා දී ඇති ආකාරයට සැලකිය යුතු බලතල ලබා දීමක් සිදු නොවේ. අන්තර්ජාතික නීතිය, සම්ප්‍රදාය හෝ භාවිතය යටතේ ජනාධිපතිවරයාට බලය පවරන ලද හෝ කළ යුතු ක්‍රියාවන්ට සහසම්බද්ධතාවයක් නැත.

ii. 33(2)(උ!) වගන්තිය යටතේ කාර්ය සාධක බලකා පිහිටුවීමට පිහිටුවීමට ජනාධිපතිවරයාට බලය පවතින්නේයැයි පිළිගත්ත ද, එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට හෝ ලිඛිත නීතියට පටහැනි නොවන්නේයැයි විශේෂයෙන් අදහස් කෙරේ. එම නිසා මෙම වගන්තියට කිසියම් ලිඛිත නීතියක් යටතේ වෙනත් අධිකාරියකට දැනටමත් පවරා ඇති කිසියම් බලයක් කාර්ය සාධන බලකායට ලබා දීමට යොදා ගත නොහැකිය.

මෙම කාර්ය සාධක බලකා පිහිටුවීමේ ගැසට් පත්‍රවල පැහැදිලිතාවයක් නොමැති නිසා ඒවායේ භූමිකාව අපේක්ෂිත නොයෙකුත් කාර්යන් සිදු කිරීමට නීතියෙන් බලය පවරන ලද නොයෙකුත් අධිකාරීන් අතර සම්බන්ධීකරණයට සීමා කිරීමට අදහස් කර ඇත් ද නැතිනම් එම කාර්යන් බලකා විසින්ම සිදුකිරීම අදහස් වේද ආයතන ද නැතිනම් ඒ දෙකම ද යන්න පැහැදිලි නැත. ඒවායේ භූමිකාව සම්බන්ධීකරණයට හෝ ප්‍රතිපත්ති සකස් කිරීමට සීමා වුවද එවැනි කාර්යන් කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහ නිත්‍යානුකුලව බලය පවරා ඇති අදාල රේඛීය අමාත්‍යංශවලට ඉඩ හැරිය නොහැක්කේ ඇයිද යන්න පැහැදිලි නැත.

නොපැහැදිලි සහ පුළුල් අධිකාරීත්වයක් හා බලතල සහිත කාර්ය සාධන බලකා පත් කිරිමේ ප්‍රවනතාවයේ නිත්‍යානුකුල භාවය පිළිබඳ ප්‍රශ්නවලට අමතරව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහ ව්‍යවස්ථාවලින් අධිකාරී බලය පවරන ලද කැබිනට් අමාත්‍යංශ සහ වෙනත් ආයතන යටපත් කිරීමේ බලවත් අනතුරක් පවතින බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය තවදුරටත් සඳහන් කරනු කැමැත්තේය. නීතියෙන් නිශ්චිත භාවයක් ලබා දිමක් නොමැතිව සහ අධීක්ෂණයක් නොමැතිව කාර්ය සාධක බලකා කීපයකින් රට පාලනය කිරීමට ජනාධිපතිවරයා යොමුවීම බලාධිකාරී පාලනයක කණගාටුදායක සලකුණු සනිටුහන් කරවයි.

## 3. කාර්ය සාධන බලකාවල අධිකාරිය

පළමුවෙන්ම ගැසට් පත්‍රයේ ඉංග්‍රීසි පිටපතේ[8] වචනවල පවතින සමහර ව්‍යාකරණ වැරදි නිසා කාර්ය සාධන බලකාවල බලතල අපැහැදිලි ය. කෙසේ වුවත් එක් එක් ගැසට් පත්‍රයක සිංහල පිටපත්වල භාෂාව සමග සැසඳීමේ දී කාර්ය සාධන බලකාවල බලතල පහත සඳහන් ආකාරයෙන් බව පෙනේ:

එක් කාර්ය සාධන බලකායට කාර්යන් ගණනාවක් පැවරේ. මෙම කාර්යන් ඉටු කිරීම සඳහා ගැසට් පත්‍රයෙන් ජනාධිපතිවරයා අදහස් කරන්නේ:

- කාර්ය සාධක බලකායට පවරා ඇති කාර්යන් සම්බන්ධයෙන් අවශ්‍ය විය හැකි විමර්ශන කිරීමට සහ නියෝග නිකුත් කිරීමට කාර්ය සාධන බලකායට බලය පැවරීම.
- වරින් වර තමාට වාර්තා ඉදිරිපත් කිරීමට කාර්ය සාධන බලකායට බලය පැවරීම.

[8] සමහර ව්‍යවස්ථාවන් හි මෙන් නොව පිටපත් අතර පටහැනි භාවයක් පවතින විට ගැසට් පත්‍රයේ කුමන පිටපත් බලපවත්නේ ද යන්න ගැන සඳහනක් මෙහ් නැති බව සඳහන් කළ යුතුය.

- නිකුත් කරන උපදෙස් පිළිපැදිය යුතු ආණ්ඩුවේ නිලධාරීන් සහ අනෙකුත් පුද්ගලයන්ට උපදෙස් නිකුත් කිරීම හෝ එසේ කළ යුතු බව ඉල්ලා සිටීමට කාර්ය සාධන බලකායට බලය පැවරීම
- ලබා දිය යුතු සියලු සහාය සහ අවශ්‍ය කරන සියලු තොරතුරු ලබා දීමට ආණ්ඩුවේ නිලධාරීන්ට සහ අනෙකුත් අයට උපදෙස් නිකුත් කිරීම
- කිසියම් ආණ්ඩුවේ නිලධාරියෙකු හෝ කිසියම් අමාත්‍යාංශයක, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක හෝ වෙනත් එවැනි ආයතනයක නිලධාරියෙකු පවරා ඇති කාර්යන් සහ වගකීම් ඉටු කිරීමේ දී ප්‍රමාද කිරීමේ හෝ පැහැර හැරීමේ සියලු සිද්ධීන් තමා වෙත වාර්තා කිරීමට කාර්ය සාධන බලකායට නියෝග කිරීම

එක් එක් කාර්ය සාධන බලකායේ මැන්ඩේට් බලය පිළිබඳ සවිස්තරාත්මක පරීක්ෂාවක් පහත වගුවල දැක්වෙන අතර ආරම්භයේ දී මතු කරන ලද ඉහත බලතල පිළිබඳව ප්‍රශ්න ගණනාවක් මතු කරයි.

i. පළමුවෙන්ම විමර්ශනය කිරීමේ සහ නියෝග නිකුත් කිරීමේ බලය හා බැඳුණ, අදහස් වන එක් එක් මැන්ඩේට් බලය පුරවැසියන්, වෘත්තිකයන්, රාජ්‍ය සේවය, ශාස්ත්‍රඥයන්. නීතිය සහ සාමය, හමුදාව, විපක්ෂය සහ වෙනත් අය කෙරේ බලපෑමක් වන අතිශයින්ම පුළුල් බලතල කාර්ය සාධන බලකායට හිමිවන අතර දේශපාලන සහ වෙනත් කාර්යන් සඳහා පුද්ගලයන් සහ ආයතන ඉලක්ක කර ගැනීමට යොමු විය හැකිය. පැහැදිලි සීමාවන් සහ අධීක්ෂණයක් නොමැති තත්වයක් තුළ මෙය විසම්මුතිය කෙරේ තිගැස්මක් ඇති කරනු ඇත.

ii. දෙවැනිව ඉහත සඳහන් බලතලවලට රාජ්‍ය නිලධාරීන්ගේ නිදහස පැහැර ගැනීමේ සහ යටපත් කිරීමේ හැකියාවක් ඇත. ආණ්ඩුවේ කාර්යාල, ස්වාධීන ආයතන සහ නීතියෙන් ප්‍රතිපාදනය ලත් අනෙක් ඒවාට ලිඛිත නීතිය යටතේ බලතල ලබා දී ඇත. කිසියම් කාර්යක් සඳහා පත් කළ කාර්ය සාධන බලකායකට මෙම බලතලවලට පටහැනිව ක්‍රියා කිරීමට බල කළ නොහැකිය.

iii. තුන් වැනිව මෙම කාර්ය සාධන බලකායන්ට තම කාර්යන් ක්‍රියාත්මක කිරිම සඳහා අරමුදල් වෙන් කර ඇත්තේ කෙසේද යන්න පැහැදිලි නැත. අමාත්‍යාංශයක ලේකම් එහි ප්‍රධාන ගණකාධිකාරී නිලධාරියා ද වේ. මෙම කාර්ය සාධක බලකා දෙකේම සභාපති වන්නේ ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් වන නිසා බැඳීම්වල ගැටුමක් ද මතු වේ. මෙම තත්වය වඩාත් සංකීර්ණ වන්නේ ක්‍රියාත්මක ව්‍යවස්ථාදායකයකින් සැලසෙන අධීක්ෂණයක් නොමැති නිසාය.

මෙම කරුණු රාජ්‍ය සේවය සහ සමස්තයක් වශයෙන් සමාජය මෙන්ම වගවීම සහ පාරදෘශ්‍ය භාවය හීන කරවන දීර්ඝ කාලීන බලපෑම්වලින් යුතුය. ඒවා වඩාත් සියුම්ව පරීක්ෂා කළ යුතුය.

## 4. 2020 ජුනි 2 වැනි දින පිහිටුවන ලද කාර්ය සාධන බලකා සම්බන්ධ නිශ්චිත ගැටලු

### අ. සුරක්ෂිත රටක්, විනය ගරුක, ගුණ ගරුක සහ නීති ගරුක සමාජයක් ගොඩ නැගීමේ ජනාධිපති කාර්ය සාධන බලකාය

#### i. කාර්ය සාධන බලකායේ අරමුණ

එහි අධිකාරී  බලය දැක්වෙන ගැසට් පත්‍රයක් තිබුණ ද කාර්ය සාධන බලකායේ අරමුණු පිළිබඳව පවතින්නේ සීමිත පැහැදිලිතාවයකි. එම පෙළ පුරා යොදා ගෙන ඇති වචන ගණනාවකම නෛතික නිර්වචනයක් නැති අතර ව්‍යාකූල නිසා පුළුල් වශයෙන් නිර්වචනය කිරීමට සහ වැරදි ලෙස යොදා ගැනීමටත් ඉඩ ඇත. නිදසුනක් වශයෙන් ''සුරක්ෂිත රටක්'' ''විනය ගරුක'' ''ගුණ ගරුක'' ''ශිෂ්ට සමාජයක්'' ''මත්ද්‍රව්‍ය භාවිතයෙන් ඇති කළ වෙනත් සමාජ ව්‍යවසනයන්' සහ ''සමාජ විරෝධී ක්‍රියාකාරකම්'' යනු ගැසට් පතේ අඩංගු අවධානය යොමු වූ සමහර වාක්‍යංශ ය.

මතු පිටින් පෙනෙන ආකාරයට කාර්ය සාධන බලකායේ අරමුණ වන්නේ භයානක මත්ද්‍රව්‍ය භාවිතය සහ ජාවාරම් කිරීම වැළැක්වීම වුවද, සමහර වචන යොදා ගෙන ඇති ආකාරයෙන් පෙන්නුම් කරන්නේ මෙම කාර්ය සාධන බලකාය වඩාත් පුළුල් සහ අනුශංගික කාර්යන් සඳහා යොදා ගැනිමට ඇති හැකියාවයි. අපැහැදිලි පාරිභාෂික යෙදුම් හා බැඳුණු සදාචාරමය පොලිස් කටයුතු, (Policing ) ඉලක්ක කර ගැනීම්, වෙනස් කොට සැළකීම් සහ අපහරණයට යොදා ගැනීමට යොමු වූ වෙනත් තත්වයන් වලදී දක්නට ඇති ආකාරයට අපැහැදිලි භාෂාව අපහරණයට අවස්ථාවකි.[9] කාර්ය සාධන බලකායේ තත්කාර්ය ස්වභාවය හා බැඳුණු මෙවැනි අපැහැදිලි යෙදුම් පැවතිමත්, එහි සංයුතියත් පොදුවේ පුරවැසියන් ගේ හැසිරීම හා සමාජය පොලිස් පරික්ෂාවට ලක් කිරීමටත් විසම්මුතිය හිර කිරීමටත් යොමු විය හැකියැයි විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය දැඩි කණස්සල්ලට පත් වේ.

#### ii. කාර්ය සාධන බලකායේ සංයුතිය

මෙම බලකාය සම්පූර්ණයෙන්ම යුක්ත වන්නේ හමුදාවේ (දැනට සේවයේ යෙදී සිටින සහ විශ්‍රාමික) නිලධාරීන්ගෙන් සහ පොලිස් නිලධාරීන්ගෙනි. කෙටියෙන් සංයුතිය වන්නේ ආරක්ෂක අමාත්‍යංශයේ ලේකම් (හමුදා විශ්‍රාමික) ත්‍රිවිධ හමුදාවේ ආඥාපතීන්, ත්‍රිවිධ හමුදාවල බුද්ධි ඒකක අධ්‍යක්ෂකයින්, වැඩ බලන පොලිස්පති, නියෝජ්‍ය පොලිස්පතීන් දෙදෙනෙකු, ජාතික බුද්ධි සේවයේ ප්‍රධානි, රාජ්‍ය බුද්ධි සේවා අධ්‍යක්ෂක සහ රේගු අධ්‍යක්ෂක ජනරාල් ය. ( මේ තිදෙනාම හමුදාවෙන් විශ්‍රාම ගිය අයයි) කාර්ය සාධන බලකායේ ප්‍රධානියා වන්නේ ආරක්ෂක අමාත්‍යංශයේ ලේකම් ය.

---

[9] නිදසුනක් වශයෙන් මෙය දණ්ඩ නීති සංග්‍රහයේ 365 අ වගන්තියේ ඇති 'පුද්ගලයන් අතර දැඩි අශිෂ්ඨ ක්‍රියා' යන යෙදුම අපහරණය කරන ආකාරයට සමානව යොදා ගත හැකිය.
Equal Ground Sri Lanka, 'Human Rights Violations against lesbian, gay, bisexual and transgender people in Sri Lanka- ආර්ථික, සමාජයීය සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ කමිටුවේ59 සැසියට ඉදිරිපත් කළ ඡායා වාර්තාව. මෙම වෙබ් අඩවියෙන් පිවිසිය හැකිය:
https;//thinternet.ohchr.org/Treaties/CESCR/Shared%20Documents/LKA/INT.CESCR.ICO.LKA.25036.E.pdf

මෙම කාර්ය සාධන බලකායේ සිවිල් නිලධාරීන් කිසිවෙකු නියෝජනය නොවීම පසුගිය මාස කීපය තිස්සේ රාජ්‍ය යාන්ත්‍රණයේ සිදු වෙමින් පවතින හමුදාකරණය හා ගැළපේ. විශ්‍රාමික හමුදා නිලධාරීන් උසස් තනතුරු ගණනාවකට[10] පත් කර ඇති අතර කොවිඩ් 19ට ප්‍රතිචාරය දැක්වීමේදී වැඩි වශයෙන්ම ඔවුන්ගේ පාලනය යටතට පත්ව ඇත. හමුදාකරණය ශ්‍රී ලංකාවට අලුත් දෙයක් නොවන නමුත් පරිපාලනයේ හමුදා සහ බුද්ධි නිලධාරීන් ස්ථාපිතවීම පෙර නොවූවිරූ මට්ටමකට පත්ව ඇත. ඉන් නීතියේ ආධිපත්‍යය, ප්‍රතිසංධානය සහ ව්‍යවස්ථාමය ප්‍රජාතන්ත්‍රවාදය කෙරේ බරපතළ බලපෑම් ඇති කරවයි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මීට පෙර අවස්ථා ගණනාවක දී හමුදාකරණය විශේෂයෙන්ම අව්‍යාජ සංහිඳියාව සහ සංක්‍රාන්තිය  යුක්තිය තවම සිදුව නැති පශ්චාත් යුධමය රටක ප්‍රජාතන්ත්‍රවාදයට නොගැලපෙන්නේ ඇයිද යන්න ගැන අදහස් දක්වා ඇත.[11] ව්‍යවස්ථාදායක අධීක්ෂණයක් නොමැතිව සමහර විට සදාචාරමය පොලිස් පරීක්ෂාව ඇතුළත්ව සිවිල් ජන ජීවිතය කෙරේ කාර්ය සාධන බලකායේ කිලිපොළා යන බලපෑම භීතියක් දනවන සුළු ය.

### iii. කාර්ය සාධන බලකායේ බලතල

ගැසට් පත්‍රයේ දක්වා ඇති ආකාරයට කාර්ය සාධන බලකායට නියමව ඇත්තේ කාර්යයන් හතරක් කිරීමටය. එම කාර්යයන් මෙසේය:

1. වර්තමානයේ රටේ යම් ස්ථානවල,නිදහස් හා සාමකාමී සමාජ පැවැත්මකට හානිකර අයුරින් මතුවෙමින් පවතින නීතිය උල්ලංඝණය කරමින් හැසිරෙන සමාජ කණ්ඩායම්වල එකී නීති විරෝධී ක්‍රියා මැඩපැවැත්වීමට අවශ්‍ය කඩිනම් පියවර ගැනීම

2. මත්ද්‍රව්‍ය උවදුරට ගොදුරුවන්නන් ඉන් වැළැක්වීම සඳහාත්,වරාය හා ගුවන් තොටුපොළ ආදී ස්ථාන හරහා පිටරටවලින් මෙරටට මත්ද්‍රව්‍ය ඇතුළු වීම වැළැක්වීම සඳහාත්,රටතුළ මත්ද්‍රව්‍ය ජාවාරම පූර්ණ වශයෙන් මර්ධනය කිරීම සඳහාත්,මත්ද්‍රව්‍ය හේතුවෙන් සිදුවන අනෙකුත් සමාජ ව්‍යවසනයන් වැළැක්වීම සඳහාත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම

3. වෙනත් රටව ස්ථානගත වෙමින් ශ්‍රී ලංකාව තළ සිදු කරනු ලබව නීති විරෝධී මෙන්ම සමාජ විරෝධී ක්‍රියා සම්බන්ධයෙන් සොයාබලා එම අපරාධවලට වගකිවයුතු පුද්ගලයන්ට එරෙහිව නීති මගින් කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගැනීම

4. බන්ධනාගාර තුළ සහ ඒ අවට සිදු කරන කිසියම් නීති විරෝධී සහ සමාජ විරෝධී ක්‍රියාකාරකම් පිළිබඳ සොයාබලා  ඒවා වැළැක්වීමට කටයුතු කිරීම

මෙම කාර්යන් හතර සිදු කිරීමේ දී කාර්ය සාධන බලකායේ භූමිකාව වන්නේ එකී කාර්යන් කිරීමට නීතියෙන් බලය පවරා ඇති අධිකාරීන් අතර සම්බන්ධීකරණයක් ද, නැතිනම් එම කාර්යන් ඔවුන් විසින්ම කිරීමට සැබෑවටම බල ගැන්වීමේ භූමිකාවක් ද යන්න පැහැදිලි නැත. නිදසුන් වශයෙන් කාර්ය සාධන බලකායට 4 වැනි කාර්යන් යටතේ සමහර නීති විරෝධී ක්‍රියාකාරකම් 'විමර්ශනය කිරීමට' බලය ලබා දී ඇත. ඉන් අදහස් වන්නේ විමර්ශන සිදු කිරීමට නීතියෙන් බලගන්වා ඇති අධිකාරීන්ට ( පොලීසිය හෝ

---

[10] 4 සටහන බලන්න.

[11] 5 සටහන බලන්න. එමෙන්ම 2012 පෙබරවාරි 17 සාර්ථක 'ප්‍රතිසංධානය සඳහා ප්‍රායෝගික පියවර' පිළිබඳ ප්‍රකාශය බලන්න. https://www.cplanka.org/practical-steps-to-meaningful-reconciliation/

අපරාධ නඩු විධාන  සංග්‍රහයේ 108 වගන්තිය යටතේ ඇමතිවරයා විසින් පත් කරන පරීක්ෂකයෙකු වැනි අයට) නියෝග දීම ද නැතිනම් විමර්ශන කිරීමට ඔවුන්ටම බලය ලබා දී ඇත්ද යන්න පැහැදිලි නැත.

එම කාර්යන් හතරේ 'මැඩලීමට පියවර ගැනීම', (කාර්ය 1) 'වැළැක්වීම' (කාර්ය 2) 'එරෙහිව නීති පියවර ගැනීම' (කාර්ය 3) සහ 'විමර්ශනය කිරීම' (කාර්ය 4) වැනි යෙදුම් ඇති අතර ඉන් අදහස් වන්නේ පසුව සඳහන් කළ පිවිසුමයැයි සිතිය හැකිය. මෙය මහත් ප්‍රශ්නකාරී වන්නේ දැනට පිහිටුවා ඇති අධිකාරීන්ට මෙම කාර්යන් සිදු කිරීමට නීතියෙන් බලය පවරා තිබීමත් (පහත වගුව බලන්න) ඔවුන් මෙම බලතල අපහරණය නොකිරීම සහතික කිරීමට සීමාවන් ඇතුළත් වන නිසාය. මෙය ඇත්තෙන්ම කාර්ය සාධන බලකායට නව බලතල පැවරීමේ උත්සාහයක් නම් එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33(2)(උ ! ) අනුව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයාට පවරා ඇති බලතල මෙන්ම මෙම කාර්යන් සිදු කිරීමට වෙනත් අධිකාරීන්ට බලය පවරා ඇති එක් එක් නීති බලාතික්‍රමණයක් ද වේ.

කාර්ය 3 යටතේ නීතිමය පියවර ගැනීමට කාර්ය සාධන බලකායට බලය පවරා තිබීම විශේෂයෙන්ම ප්‍රශ්නකාරී ය. විශේෂයෙන්ම ශ්‍රී ලංකාවෙන් පිටත පුද්ගලයන්ට අදාල වන සන්දර්භයක් යටතේ ඉන් අදහස් වන්නේ කුමක් ද යන්න පැහැදිලි නැත. මෙය නීතිපති නොවන නමුත් ඔහුගේ පහළ නිලධාරියෙකුට කාර්ය සාධන බලකායේ නියෝජනයක් ලබා දීම තුළින් ඔහුගේ බලතල පැහැර ගැනීමක් සේ පෙනේ. අපරාධ නඩු විධාන  සංග්‍රහයේ 12 වගන්තිය යටතේ මහාධිකරණය ඉදිරියේ නඩු විභාග කරනු ලැබීම සඳහා  චූදිත තැනැත්තාට විරුද්ධව නීතිපතිවරයා විසින් හෝ නීතිපති වරයාගේ මෙහෙයවමින් අධිචෝදනා කර ඇත්නම් මිස"මේ සංග්‍රහයේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවාධානවලට යටත්ව"මහාධිකරණය විසින් යම් වරදක් සංජානනය නොකළ යුතුය අයුරින් දක්වා තිබීම හේතුවෙන්  මහාධිකරණයේ නඩු පැවරිය හැකිවනුයේ නීතිපතිවරයාට පමණි.[12]

මෙය වඩාත් අවදානම් සහිත වන්නේ මෙම කාර්ය යටතේ මත්ද්‍රව්‍ය ( Narcotics ) ගැන සඳහනක් නොවීමෙනි. ඉන් අදහස් වන්නේ නීතිපති දෙපාර්තමේන්තුව ඉක්මවා ගොස් මත්ද්‍රව්‍යවලට සම්බන්ධයක් නැති වැරදි ගැන පවා නීතිමය පියවර ගැනීමට කාර්ය සාධන බලකායට අවසරය ලබා දීමේ උත්සාහයකි.

කාර්ය සාධන බලකායේ භූමිකාව නීති පියවර ගැනීමට නීතිපතිගෙන් ඉල්ලා සිටීමට සීමා වන්නේනම් එවැනි ඉල්ලීමක් නීතිපතිගේ අභිමතානුසාරී බලය කෙරේ ඇති කෙරෙන බලපෑම ගැන ප්‍රශ්න මතු කරයි. කාර්ය සාධන බලකායට රාජ්‍ය නිලධාරීන්ට 'උපදෙස් නිකුත්' කිරීමට බලය පවරා ඇත. කෙසේ වුවත් එවැනි බලයක් ව්‍යවස්ථාවකින් ලබා නොදෙන්නේ නම් කාර්ය සාධන බලකායට නීතිපතිට උපදෙස් නිකුත් කිරීමට බලයක් ලබාදිය නොහැකිය. එවැනි උපදෙස් ක්‍රියාත්මක කිරීමක් බලාතික්‍රමණක් විය හැකිය.

---

[12] නිදසුනක් වශයෙන් ශ්‍රී ලංකාවට භයානක මත්ද්‍රව්‍ය ආනයනය කිරීම පිළිබඳව "විෂ වර්ග"අබිං සහ අන්තරදායක ඔ ! ෂධ ආඥා පනතේ 54අ (ඇ) වගන්තිය යටතේ වන වැරදි

විශේෂිත කාර්යන් පිළිබඳව ඇති තවත් ගැටලු මෙන්ම මෙම බලතල දැනටමත් යොදා ගන්නේ කුමන නීති යටතේ ද යන්න පහත වගුවෙන් පරීක්ෂා කෙරේ.

| කාර්ය | විකල්ප නීති සහ යාන්ත්‍රණ | අදහස් |
|---|---|---|
| 1. රටේ සමහර තැන්වල දැනට නිදහස් සහ සාමකාමී පැවැත්මට හානිකර ලෙස මතු වන්නා වූ සහ නීතිය උල්ලංඝනය කරන්නා වූ සමාජ කණ්ඩායම්වල නීති විරෝධී ක්‍රියාකාරකම් මැඩලීමට අවශ්‍ය පියවර වහාම ගැනීමට | මෙම කාර්යට ඇතුළත් වන්නේ කුමන වැරදි ද යන්න හෝ 'මැඩලීම' යනුවෙන් ගැනෙන්නේ කුමන ක්‍රියාකාරකම් ද යන්න ගැන සඳහනක් නොවන නිසා නොදනී | මෙම කාර්ය අතිශයෙන්ම නොපැහැදිලි වන අතර ප්‍රශ්න ගණනාවක් මතු කරයි. ''නීති විරෝධී ක්‍රියාකාරකම්'' යන්නෙන් නීති විරෝධී හෝ නීතිය යටතේ අපරාධයක් බවට සඳහන් කුමන හෝ ක්‍රියාකාරකමත් අදහස් වනු විය හැකිය. 'නිදහස් සහ සාමකාමී සමාජ පැවැත්මට හානිකර' යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි පැහැදිලි නැත. කෙසේ වුවත් එය විසම්මුතිය හිර කිරීමට යොදා ගැනීම නිසා මෙම යෙදුම අපහරණය කිරීමට බෙහෙවින් ඉඩකඩ පවතී. |
| 2. මත්ද්‍රව්‍ය උවදුර වැළැක්වීමට, වරාය සහ ගුවන් තොටුපොළවලින් විදෙස් රටවල සිට මත්ද්‍රව්‍ය රට තුළට ගෙන ඒම වැළැක්වීමට සහ රට තුළ මත්ද්‍රව්‍ය ජාවාරම සම්පූර්ණයෙන්ම තුරන් කිරීමට සහ මත්ද්‍රව්‍ය අපරණයෙන් හට ගන්නා අනෙකුත් සමාජ ව්‍යාධීන් වැළැක්වීමට අවශ්‍ය පියවර ගැනීම, | 1984 අංක 11 ජාතික අන්තරායකාරී ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩල පනත එහි 2 වගන්තිය යටතේ මණ්ඩලයක් පිහිටුවයි. සාමාජිකයන් සමන්විත වන්නේ වෘත්තීන් සහ විවිධ ක්ෂේත්‍ර නියෝජනය වන ආකාරයෙනි. පනතේ 7 වගන්තිය යටතේ මණ්ලයට පවරා ඇති බලතල මෙම කාර්ය සාධනයෙන් බලාතික්‍රමණය කරන බවක් පනේ.<br><br>මෙම බලතලවලට අන්තරායකාරී ඖෂධ අපහරණය වැළැක්වීම සහ පාලනයට අදාල ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම ( 7(අ) වගන්තිය) අන්තරායකාරී ඖෂධ වැළැක්වීමේ සහ පාලනයේ නිරත ආයතනවල ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය ( 7(ඇ) වගන්තිය) ඒවාට ඇබ්බැහි වූ පුද්ගලයන් සඳහා ප්‍රතිකාර සහ පුනරුත්ථාපනය ප්‍රවර්ධනය ( 7(ඉ) වගන්තිය) සහ අන්තරායකාරී ඖෂධ අපහරණයේ සමාජයීය, සංස්කෘතික සහ ආර්ථික බලපෑම් පිළිබඳව පර්යේෂණ අධ්‍යයනයකිරීම ( 7(ඊ) වගන්තිය)<br>2007 අංක 54 දරන ඖෂධවලට ඇබ්බැහි තැනැත්තන් (ප්‍රතිකාර හා පුනරුත්ථාපනය) පිළිබඳ පනත. ඉන් ප්‍රතිකාර මධ්‍යස්ථානවලට පුද්ගලයන් ඇතුළත් කර ගැනීමේ ක්‍රියා පටිපාටිය සලසයි. ( 9 වගන්තියෙන් | 'මත්ද්‍රව්‍ය හේතුවෙන් හට ගන්නා අනෙකුත් සමාජ ව්‍යවසනයන් වැළැක්වීම' යන යෙදුමට නීතිමය නිර්වචනයක් නැත. එය මත්ද්‍රව්‍ය මත යැපීමට සීමා කළ යුතුව තිබිණ. එහෙත් 'සමාජ ව්‍යවසනයන්' යන යෙදුම නිසා 'මත්ද්‍රව්‍ය අපහරණයට' නොයෙකුත් නෛතික ක්‍රියාකාරකම් ආරෝපනය කිරීමට හැකි වනු ඇත. එහි ප්‍රතිඵලය වන්නේ කාර්ය සාධනය විසින් සමාජය සදාචාරමය පොලීසියකට ලක් කරනු ලැබීම ය. |

| | | |
|---|---|---|
| | ස්වේච්ඡා ඇතුළත් කර ගැනීම ගැන සඳහන් වන අතර 10 වගන්තියෙන් අනිවාර්ය ඇතුළත් කර ගැනීම් ගැන සඳහන් වේ.)<br><br>පනතේ 7 වගන්තියෙන් විෂය පිළිබඳ විශේෂඥයන්ගෙන් සමන්විත තුලනීක්ෂණ මූල මණ්ඩලයක් පිහිටුවයි. තත්තාලීන අන්තරාදායක ඔ ! ෂධ ඇබ්බැහියට ප්‍රතිකාර ලබන තැනැත්තන් තුලනීත්ෂණය සහ අනාගත පුනරුත්ථාපන වැඩසටහන් ඇගයීම පිණිස එම තුලනීක්ෂණ මූල මණ්ඩල පත්කරන අතර "ඒවායේ බලතල සහ කාර්යය නියෝග මගින් නියම කරනු ලබන ආකාරයට විය යුතු බව පනතේ 7(3) වගන්තියෙන් දක්වා ඇත '<br><br>මෙම පනත යටතේ රෙගුලාසි ඇමතිවරයා (21(1) වගන්තිය) විසින් නිකුත් කළ යුතු අතර ඊට පාර්ලිමේන්තු අනුමැතිය (21(4) වගන්තිය) ලබා ගත යුතුය.<br><br>රේගු ආඥාපනත යටතේ රටට ඇතුළුවන ගමන් මළු, යාත්‍රා සහ පුද්ගලයන් පරික්ෂා කිරීමට ප්‍රතිපාදන ලබා දේ. 107අ වගන්තිය යටතේ ශ්‍රී ලංකාවට ඇතුළු වන පුද්ගලයන් සහ ගමන් මළු පරික්ෂා කිරීමට ප්‍රතිපාදන සලසන අතර කිසියම් තහනම් භාණ්ඩයක් අත් අඩංගුවට ගත හැකිය. මෙම පරික්ෂාව සිදු කළ යුතු වන්නේ ඇමතිවරයා විසින් නියම කරන රෙගුලාසි අනුවය. (107අ(1) වගන්තිය ඒවා පාර්ලිමේන්තුව අනුමත කළ යුතුය. (107අ(4)<br><br>118 වගන්තිය අනුව රේගු නිලධාරීන්ට ශ්‍රී ලංකාවේ ඕනෑම වරායක ඇති කවර හෝ නැවකට ඇතුළු වී තහනම් බඩු ඇත්දැයි පරික්ෂා කළ හැකිය.<br><br>138 වගන්තිය අනුව රේගු නිලධාරීන්ට ඕනෑම වරායක, ගුවන් තොටු පොළක සිටින පුද්ගලයන්, ඔවුන්ගේ ගමන් මළු හෝ ඔවුන්ට අයත් දේ හෝ ගොඩ බසින ලද පුද්ගලයන් හෝ සංක්‍රාන්ත වන අය පරික්ෂා කළ හැකිය. එහෙත් එය කළ හැකි වන්නේ එබඳු පුද්ගලයන් සතුව තහනම් භාණ්ඩ ඇතැයි විශ්වාස කිරීමට ප්‍රබල හේතු ඇත්නම් පමණි.<br><br>පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය 1973 දී පිහිටුවන ලද අතර එහි කාර්ය වන්නේ මත්ද්‍රව්‍ය පිළිබඳ නීති ක්‍රියාත්මක කිරීම යි. ඒ ආකාරයටම ශ්‍රී ලංකාවේ රේගුවේ ද ද මත්ද්‍රව්‍ය පාලන ඒකකය මත්ද්‍රව්‍ය ජාවාරම වැළැක්වීමට අදාල නීති ක්‍රියාත්මක කරයි.<br><br>පහත සඳහන් පනත්වල මත්ද්‍රව්‍ය ජාවාරමට අදාල නීති ඇතුළත් ය. කාර්ය සාධන බලකාය ඒවා ක්‍රියාත්මක | එකී 'සමාජ ව්‍යවසන' යන්න මත්ද්‍රව්‍ය මත යැපීමට සීමා කළත් කාර්ය සාධන බලකායට එකද වෛද්‍ය නිලධාරියෙකු ඇතුළත්ව නැත. මත්ද්‍රව්‍ය මත යැපීම සංවේදී කරුණක් වන අතර හමුදාමය බලය යෙදවීමෙන් විසඳිය හැකි කරුණක් නොවේ. |

| | | |
|---|---|---|
| | කිරීමට හෝ ඒවා ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණයට අදහස කරන්නේද යන්න පැහැදිලි නැත.<br><br>වස, අබිං සහ අන්තරායකාරී ඖෂධ ආඥාපනතේ 54අ වගන්තියෙන් අන්තරායකාරී ඖෂධවලට අදාල සමහර වැරදි දක්වා ඇත. ඊට නොයෙකුත් මත්ද්‍රව්‍ය නොයෙකුත් ප්‍රමාණයෙන් නිෂ්පාදනය, ජාවාරම, ආනයනය, අපනයනය සහ සන්තකයේ තබා ගැනීමට අදාල වැරදි ඇතුළත් ය.<br><br>2008 අංක 1 මත්ද්‍රව්‍ය වන ඖෂධ සහ මනසට බලපාන පදාර්ථ නීතිවිරෝධීව ජාවාරම් කිරීමට එරෙහි සම්මුතිය( Convention against Illicit Traffic in Narcotics drugs and Psychotropic Substances ) පනතේ වැරදි ගණනාවක් දක්වා ඇති අතර එහි ප්‍රතිපාදන ශ්‍රී ලංකාව ක්‍රියාත්මක කළ යුතුය. මෙම පනතේ 2(1)අ වගන්තියේ ලැයිස්තුව අනුව කිසියම් මත්ද්‍රව්‍ය ඖෂධයක් හෝ මනසට බලපාන පදාර්ථයක් ආනයනය හෝ ජාවාරම් කිරීම වරදකි. කෙසේ වුවත් 2(2) වගන්තිය අනුව පුද්ගලයෙකු ශ්‍රී ලංකාවෙන් බැහැරව සිට එවැනි වරදක් කිරීමට උත්සාහ කිරීම, අනුබලදීම සහ කුමන්ත්‍රණය කිරීම ඔවුන් ජීවත් වන්නේ කොතැනද යන්න නොසලකා වරදක් සිදු කළාසේ සැලකිය යුතුය.<br><br>4(2) වගන්තියෙන් අන්තර්ජාතිකව සංවිධානය වූ අපරාධවලට සම්බන්ධවීම ඇතුළත් තත්වය උග්‍ර කරවන්නා වූ සමහර වාතාවරණයන් සඳහා ප්‍රතිපාදන දක්වා ඇත. 4(2)(ආ) වගන්තිය | |
| 3. පිටරටවල සිටිමින් ශ්‍රී ලංකාව තුළ නීති විරෝධී සහ සමාජ විරෝධී කටයුතු මෙහෙයවන පුද්ගලයන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය පියවර ගැනීම | 1977 අංක 8 උද්‍රපන නීතියේ 17(1) වගන්තියෙන් පොදුරාජ්‍ය මණ්ඩලයේ රටකින් හෝ ගිවිසුම්ගත රාජ්‍යයකින් පුද්ගලයෙකු උද්‍රපනය කිරීමේ ක්‍රියා පටිපාටියට ප්‍රතිපාදන ලබා දේ. මෙම වගන්තිය අනුව උද්‍රපනය සඳහා වූ ඉල්ලීම කළ යුතු වන්නේ ඇමතිවරයාය.<br><br>17(2) වගන්තියෙන් උද්‍රපනය කරනු ලැබූ පුද්ගලයා නඩු විභාගයකට ලක් කළ හැකි වැරදි පිළිබඳ සීමා දක්වා ඇති අතර 18 වගන්තියෙන් මාස හයක් ඇතුළත නීති ක්‍රියා පටිපාටි ආරම්භ නොවන්නේ නම් හෝ ඔහු නිදහස් හෝ ආක්ෂේපනය කරන්නේ නම් ඇමතිවරයා එම පුද්ගලයා නොමිලයේ ආපසු යැවිය යුතුය.<br><br>19 වගන්තියෙන් මෙම පනත යටතේ රෙගුලාසි සකස් කිරීමට ඇමතිවරයාට බලය පැවරේ.<br><br>2008 අංක 1 මත්ද්‍රව්‍ය වන ඖෂධ සහ මනසට බලපාන පදාර්ථ නීතිවිරෝධීව ජාවාරම් කිරීමට එරෙහි සන්ධානය ( Convention against Illicit Traffic in Narcotics drugs and Psychotropic Substances ) පනත යටතේ එකී පනත යටතේ සිදු කරන ලද වැරදිවලට අදාලව උද්‍රපනය සඳහා විශේෂ ප්‍රතිපාදන සලසයි. උද්‍රපන | 'නීති පියවර ගැනීම' යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද සහ එසේ කිරීමේ බලය සහ ක්‍රියා පටිපාටියට ඉඩ සැලසෙන ව්‍යවස්ථා නොමැති අවස්ථාවක එසේ කිරීමට කාර්ය සාධන බලකායට බලය ලැබෙන්නේ කෙසේද යන්න පැහැදිලි නැත. ශ්‍රී ලංකාවෙන් පිටත වෙසෙන පුද්ගලයන්ට එරෙහිව අවශ්‍ය නීතිමය පියවර ගැනිමට කාර්ය සාධන බලකාය කටයුතු කරන්නේ නම් එම වැරදි දේශීය උසාවිවලට අධිකරණ බලය ඇති වැරදිවලට සීමාවීම අවශ්‍ය ය. |

| | | |
|---|---|---|
| | නීතියේ වගන්ති 10 සහ 24න් වැරදි මෙම පනත් යටතට පත් කිරීම සඳහා සංශෝධනය කෙරේ.<br><br>13 වගන්තියෙන් උදර්පන නීතියක් නැති අවස්ථාවක වුවත් එක්සත් ජාතීන්ගේ 2008 අංක 1 මත්ද්‍රව්‍ය වන ඖෂධ සහ මනසට බලපාන පදාර්ථ නීති විරෝධීව ජාවාරම් කිරීමට එරෙහි සම්මුතිය ( Convention against Illicit Traffic in Narcotics drugs and Psychotropic Substances ) ඊට අත්සන් කළ රටවල් අතර පවතින උදර්පන ගිවිසුමක් සේ සැලකිය හැකිය. කෙසේ වුවත් ඇමතිවරයා ඒ සඳහා නියෝගයක් ගැසට් පත්‍රයක් මාර්ගයෙන් පළ කළ යුතුය. ඒ ආකාරයටම 25 වගන්තියෙන් ඇමතිවරයාට 1990 මත්ද්‍රව්‍ය වන ඖෂධ සහ මනසට බලපාන පදාර්ථ නීති විරෝධීව ජාවාරම් කිරීමට එරෙහි සාර්ක් සම්මුතිය ( Convention against Illicit Traffic in Narcotics drugs and Psychotrpic Substances ) සාර්ක් රටවල් අතර උදර්පන ගිවිසුමක් සේ යොදා ගත හැකිය. | මෙම කාර්යෙන් අදහස් වන්නේ කාර්ය සාධන බලකායට පුද්ගලයන් ශ්‍රී ලංකාවට උදර්පනය කිරීමට පියවර ගත හැකිය යන්නයි. එවැනි ක්‍රියාවකදී නීතියෙන් ප්‍රතිපාදනය කර ඇති ක්‍රියා පටිපාටිය අනුගමනය කිරීමත් ඒවාට බලය අපහරණය කිරීම වැළැක්වෙන සීමා ඇතුළත්වීමත් වැදගත් ය.<br><br>මෙම කාර්යේ මත්ද්‍රව්‍ය ජාවාරම හා සම්බන්ධ වැරදි ගැන සඳහන් වන්නේ නැත. කාර්ය සාධන බලකායේ මැන්ඩේට් බලය කාර්ය 2 හි විස්තර කරන මත්ද්‍රව්‍ය ජාවාරම සම්බන්ධ අපරාධවලට සීමා වන්නේ දැයි පැහැදිලි නැත.<br><br>සමාජ විරෝධී ක්‍රියාකාරකම් යන යෙදුම අපැහැදිලිය. එමනිසා අපහරණයට යොදා ගත හැකිය. |
| | | |
| 4. බන්ධනාගාර තුළ සහ ඒ අවට සිදු කරන කිසියම් නීති විරෝධී සහ සමාජ විරෝධී ක්‍රියාකාරකම් විමර්ශනය සහ වැළැක්වීමට | අපරාධ නඩු විධාන සංග්‍රහයේ V වැනි පරිච්ඡේදයේ විමර්ශනයක් කළ යුතු ආකාරය විස්තර කෙරේ. එහි ඇතුළත් බලතල සංග්‍රහයේ 108 වගන්තිය යටතේ ඇමතිවරයා විසින් පත් කරන සමහර පොලිස් නිලධාරීන්ට හෝ විමර්ශකයාට පමණක් ලබා දී ඇත.<br>බන්ධනාගාර ආඥා පනතේ X කොටසේ බන්ධනාගාරවලට අදාල වැරදි විස්තර කර ඒවා විමර්ශනය කළ යුත්තේ හෝ දඬුවම් දිය හැකි වන්නේ කෙසේද කවුරුන් විසින් ද යන්න දක්වා ඇත. | ක්‍රියාවක් සමාජ විරෝධී වන්නේ නම්( එම යෙදුම කුමන ආකාරයෙන් නිර්වචනය කළ ද) නීති විරෝධී නොවන්නේ නම් එය කාර්ය සාධන බලකායට වැළැක්විය නොහැකිය. |

## ආ. නැගෙනහිර පළාතේ පුරා විද්‍යාත්මක උරුමයන් කළමනාකරණය සඳහා වූ ජනාධිපති කාර්ය සාධන බලකාය

### i. පසුබිම

2020 මැයි 14 නැගෙනහිර පළාතේ ආණ්ඩුකාරවරයා, ආරක්ෂක අමාත්‍යංශයේ ලේකම්, ආරක්ෂක කාර්ය මණ්ඩල ප්‍රධානි සහ හමුදා ආඥාපති, නාවික හමුදා ආඥාපති, වැඩ බලන පොලිස්පති, ජාතික බුද්ධි අංශ ප්‍රධානි, ආරක්ෂක බලකා ආඥාපති- නැගෙනහිර, ඇතුළු දූත පිරිසක් හමුදා සහ පොලිස් නිලධාරීන් සමග දීඝවාපිය සහ පොතුවිල් ප්‍රදේශයේ සංචාරය කළහ.[13]

නියෝජිත කණ්ඩායම පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ඉඩම් අල්ලා ගැනීමේ චෝදනා සහ මහජන දුක්ගැනවිලි ගණනාවක් සොයා බැලීමට ප්‍රදේශයේ සංචාරය කෙළේය. කෙසේ වුවත් 1940 අංක 9 පෞරාණික වස්තු පිළිබඳ ආඥාපනත අනුව පුරා විද්‍යාත්මක වැදගත් කමකින් යුත් ඉදි කිරීම් හෝ ස්ථාන නොසලකා හැරීම හෝ හානි කිරීමේ තත්වයන් ගැන කටයුතු කිරීමට ඇමතිවරයාට බලය පවරා ඇත.

2020 මැයි 16 වැනිදා ආරක්ෂක ලේකම් ජනාධිපතිගේ උපදෙස් අනුව පොතුවිල් මහා විහාරය සහ අවට භූමිය ආරක්ෂා කිරීමට නාවික හට කණ්ඩායමක් වහාම පිහිටුවීමට නාවික ආඥාපතිට නියෝග කෙළේය.[14] ඉන් පසුව බෞද්ධ උපදේශක මණ්ඩලයේ රැස්වීමක දී නැගෙනහිර පුරාවිද්‍යාත්මක ස්ථාන සම්පූර්ණයෙන්ම සමීක්ෂණ කිරීමට සහ ඒවා සංරක්ෂණයට පියවර ගැනීම සඳහා ජනාධිපති කාර්ය සාධන බලකායක් පිහිටුවන බව ජනාධිපති පැවසුවේය.[15]

ජුනි 2 වැනි දා නැගෙනහිර පළාතේ පුරාවිද්‍යාත්මක උරුමය කළමනාකරණය සඳහා ජනාධිපති කාර්ය සාධන බලකායක් පිහිටුවන ලද්දේ ඉන් අනතුරුව ය. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මීට පෙර ද නැගෙනහිර පළාතේ සංකීර්ණ සහ ගැටුම්කාරී ඉඩම් ප්‍රශ්නය ගැන අදහස් දැක් වූ අතර ඊළඟ පියවර ගැනීමේ දී පාරදෘශ්‍ය සහ සියල්ලන් ඇතුළත් කර ගන්නා ක්‍රියාවලියක අවශ්‍යතාවය අවධාරණය කෙළේය.[16] ශ්‍රී ලංකාවේ ඉඩම් ගැටලු විසඳීමට ජාතික ඉඩම් කොමිසමක් පිහිටුවීම ඇතුළත් 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නැවතත් අවධාරණය කරයි.

### ii. කාර්ය සාධන බලකායේ සංයුතිය

කාර්ය සාධන බලකාය සමන්විත වන්නේ බෞද්ධ භික්ෂූන් දෙදෙනෙකු, ආරක්ෂක අමාත්‍යංශයේ ලේකම්, ආණ්ඩුවේ නිලධාරීන් හතරක් ( එනම් පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්, ඉඩම් කොමසාරිස් ජනරාල්, මිනුම්පති සහ පළාත් ඉඩම් කොමසාරිස් (නැගෙනහිර පළාත), ශස්ත්‍රාචාර්යවරුන් දෙදෙනෙකු (එනම් කැළණිය විශ්ව විද්‍යාලයේ මහාචාර්ය රාජ් කුමාර් සෝමදේව, පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ මහාචාර්ය

---

[13] පොතුවිල් මුහුදු මහා විහාර ප්‍රදේශයේ මෑතක ඇති තත්වය පිළිබඳ ප්‍රකාශයඃ ඉඩම් අත්පත් කර ගැනීමේ නීතියේ අවභාවිතය සහ හමුදාව. ඉඩම් අයිතිය පිළිබඳ ජනතා සංධානය 20202 මැයි 20. https://drive.google.com/file/d/1uXb7fZSvH6nlYOhYC6qxEqHDzAN1-bf/view

[14] පොතුවිල් මහා විහාරය ආරක්ෂා කිරීමට හට කණ්ඩායමක් පිහිටුවීමට නාවික හමුදාවට උපදෙස් නිකුත් කෙරේ. 2020 මැයි 16 Businessnews.lk https://www.businessnews.lk/2020/05/16/navy-instructed-to-establish-contingent-to-protect-the-pottuvil-muhudu-maha-vihara-temple/

[15] පුරාවිද්‍යා ස්ථාන රැකීමට ජනාධිපති කාර්ය සාධක බලකායක් ජනාධිපති මාධ්‍ය ඒකකයළ 2020 මැයි 22 http://www.pmdnews.lk/presidential-task-force-to-protect-archaeological-sites/

[16] නැගෙනහිර පළාතේ ඉඩම්ඃ දේශපාලනය, ප්‍රතිපත්ති සහ ගැටුම් https://www.cpalanka.org/land-in-the-eastern-provincepolitics-policy-and-conflict/

කපිල ගුණවර්ධන, බස්නාහිර පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සහ පුද්ගලික මාධ්‍ය ජාලයක සභාපති යි.

කාර්ය සාධන බලකායේ අධිකාරී බලය නැගෙනහිර පළාතට සීමාවී තිබිය දී පොලිස් නියෝජනය සඳහා බස්නාහිර පළාතේ නියෝජ්‍ය පොලිස්පති පත් කර ඇත්තේ ඇයි ද යන්න පැහැදිලි නැත. තවදුරටත් පෞද්ගලික මාධ්‍ය ජාලයක නියෝජිතයෙකු පත් කිරීම ද පැහැදිලි නැත.

ආණ්ඩුවේ නිලධාරීන් නොවන පුද්ගලයන් කාර්ය සාධන බලකායේ සිටීම බරපතල ප්‍රශ්න මතු කරවයි. මින් ආණ්ඩුවේ නිලධාරීන් නොවන පුද්ගලයන්ට ආණ්ඩුවේ නිලධාරීන්ට උපදෙස් ලබා දීමට සහ නියෝග කිරීමට බලය පැවරේ. එවැනි පුද්ගලයන් අල්ලස් පනත යටතේ ආණ්ඩුවේ නිලධාරීන් නිලධාරීන් ලෙස නිර්වචනය කිරීමට ඇතුළත් වන්නේ ද යන්න සහ ඔවුන් සාමාන්‍ය ආණ්ඩුවේ නිලධාරීන්ට වඩා අඩුවෙන් පරික්ෂාවට ලක් වන්නේ ද යන්නත් පැහැදිලි නැත.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය[17] මීට පෙර සඳහන් කළ ආකාරයට මෙම කාර්ය සාධන බලකායේ සියලු පූජ්‍ය පක්ෂය නියෝජනය එකම ආගමකට අයත් වන අතර එකම වාර්ගික සංයුතියකින් යුතුය. මෙසේ සිදුව ඇත්තේ නැගෙනහිර පළාතේ ජන සංඛ්‍යාවේ විවිධත්වයත් සියලුම ප්‍රජාවන්ගේ පුරාවිද්‍යා නියෝජනයත් උද්ගතව ඇති ගැටලුව වටා සංකීර්ණත්වයත් තිබිය දීය. මෙවැනි ගැටුම්කාරී සහ සංවේදී වටපිටාවක විශ්‍රාමික මේජර් ජනරාල් කෙනෙකුගේ ප්‍රධානත්වයෙන් තනිකර සිංහල කාර්ය සාධන බලකායක් පිහිටුවා ඊට අනන්‍යතා දේශපාලනය, ජනවිද්‍යාත්මක තත් ත්වය, ඉඩම් පාලනය සහ භාවිතාව සහ සංහිඳියාව කෙරේ සැලකිය යුතු බලපෑමක් විය හැකි ගමන් මාර්ගයක් නිර්ණය කිරීමේ පුළුල් අධිකරී බලයක් දීම වික්ෂිප්ත කරවන්නකි.

## iii. කාර්ය සාධන බලකායේ අධිකාරී බලය

ගැසට් පත්‍රයේ දැක්වෙන ආකාරයට කාර්ය සාධන බලකායට කාර්යන් හතරක් කිරීමට නියම කර ඇත. ඒවා පහත සඳහන් ආකාරයට යඃ

1. නැගෙනහිර පළාතේ පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථාන හඳුනා ගැනීම.

2. එසේ හඳුනාගත් ස්ථාන සහ පුරාවස්තූන් සංරක්ෂණය සහ ප්‍රතිස්ථාපනය කිරීමෙන් පුරාවිද්‍යාත්මක උරුමය කළමනාකරණය සඳහා සුදුසු වැඩපිළිවෙලක් හඳුනා ගැනීම සහ ක්‍රියාත්මක කිරීම

3. එවැනි පුරාවිද්‍යාත්මක ස්ථානවලට වෙන් කළ යුතු ඉඩම් ප්‍රමාණය හඳුනා ගැනීම සහ ඒවා නිසි පරිදි සහ නිත්‍යානුකූලව වෙන් කිරීමට අවශ්‍ය පියවර ගැනීම

4. පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් භූමි ප්‍රදේශයන්හි සංස්කෘතිකමය වටිනාකම් සුරක්ෂිත කරමින් ශ්‍රී ලාංකීය අනන්‍යතාවය දේශීයව මෙන්ම ජාත්‍යන්තරව ප්‍රචලිත කිරීම සහ එකී උරුමයන් ප්‍රවර්ධනය සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම

[17] 5 සටහන බලන්න.

තවදුරටත් සුවිශේෂිත කාර්යන් පිළිබඳ ගැටලු මෙන්ම දැනටමත් එම බලතල යොදා ගැනිමට පදනම් වන නීති පහත වගුවෙන් පරික්ෂා කෙරේ.

| කාර්ය | විකල්ප නීති සහ යාන්ත්‍රණ | අදහස |
|---|---|---|
| 1. නැගෙනහිර පළාතේ පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථාන හඳුනා ගැනීම. | 1940 අංක 9 පුරාවස්තු ආඥාපනත<br><br>ආඥාපනතේ 16(1), 17(1) සහ 18 අනුව ඇැමතිවරයාට පැවති හෝ පවතින්නේයැයි විශ්වාස කරන කිසියම් පෞරාණික ස්මාරකයක් හෝ ආරක්ෂිත ස්මාරකයක් සේ ප්‍රකාශ කළ හැකිය.<br><br>19 වගන්තිය අනුව එවැනි නියෝගයක් පිළිබඳ දැනුම් දීමක් විරෝධය පළ කිරීමේ අවස්ථාවක් සහිතව ගැසට් කළ යුතුය.<br><br>24(1) වගන්තිය යටතේ කිසියම් පෞරාණික ස්මාරකයක සිට නියමිත දුරක් ඇතුළත ගොඩනැගිලි ඉදි කිරීම තහනම් කිරීමේ හෝ සීමා කිරීමේ රෙගුලාසි නිකුත් කළ හැකිය. 25(1) වගන්තිය යටතේ එවැනි තහනම් කිරීමකින් බලපෑමට පත්වන ඉඩමක හිමිකරුට වන්දියක් ඉල්ලා සිටිය හැකිය.<br><br>26-30 වගන්ති යටතේ එවැනි ඉල්ලීමක් ලැබුණ පසු ඇමතිවරයාට වන්දි මණ්ඩලයක් පත් කොට එම ඉල්ලීම එම මණ්ඩලයට යොමු කළ හැකිය. මණ්ඩලය එම ඉල්ලීම පිළිබඳව පරික්ෂා කොට එහි තීරණය ලබා දිය යුතුය. ඉල්ලුම්කරුට හෝ පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්ට මණ්ඩලයේ කිසියම් තිරණයක් පිළිබඳව ඉල්ලීම කරන ඉඩම පිහිටි දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් උසාවියට අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය.<br><br>33(1) යටතේ පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්ට ඉඩම් කොමසාරිස් ගේ හෝ ඇමතිවරයා ගේ අනුමැතිය ඇතිව කිසියම් ප්‍රදේශයක් පුරාවිද්‍යාත්මක රක්ෂිතයක් ලෙස ප්‍රකාශ කළ හැකිය.<br><br>34 වගන්තිය යටතේ එවැනි රක්ෂිතයකට අනවසරයෙන් ඇතුළුවන ඕනෑම පුද්ගලයෙකුට මහෙස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පැවැත් වෙන ලඝු නඩු විභාගයකින් පසු වැරදිකරු වු විට දඩයක් ගෙවීමට හෝ සිරගත කිරීමට යන එකකින් හෝ ඒ දෙකින්ම දඬුවම් කළ හැකිය.<br><br>39අ (1) වගන්තිය යටතේ ඇමතිවරයාට ගැසට් පත්‍රයේ පළ කරන නියෝගයකින් පුරාවිද්‍යාත්මක උපදේශක කමිටුවක්පත් කළ හැකිය. (මින් පසුව උපදේශක කොමිටිය යනුවෙන් හැඳින් වෙන)<br><br>40 වගන්තිය අනුව පුරාවිද්‍ය අධ්‍යක්ෂ ජනරාල්ට<br>(ආ) ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක උරුමය පිළිබඳ ලේඛනයක් සකස් කිරීම | මෙම කාර්ය සඳහා පවතින නීතියෙන් ප්‍රතිපාදන තිබිය දී කාර්ය සාධන බලකායක් ඇයි ද යන ප්‍රශ්නය ඇසිය හැකිය.<br><br>'පුරාවිද්‍යාත්මක' යන නිර්වචනය තුළට ඇතුළත් වන්නේ කුමක්ද යන්න ගැන විස්තර සපයා නැත.<br><br>කාර්ය සාධන බලකායේ ක්‍රියාකාරකම් සිදු කිරීමට එම බලකායට බලය පවරා ඇති ගැසට් නිවේදනයේ කාර්ය සාධන බලකායේ කිසියම් තිරණයක් අභියෝගයට ලක් කිරීමේ ප්‍රතිපාදනයක් දක්වා නැත.<br><br>පවතින ව්‍යවස්ථා අනුව පුරාවිද්‍යාත්මක වටිනාකමක් ඇති ස්ථාන හඳුනා ගෙන අත්පත් කර ගැනීමට බලය පවරා ඇති පුද්ගලයන්ගේ සහ යාන්ත්‍රණවල තිරණ උසාවියකින් හෝ අර්ධ අධිකරණ මණ්ඩලවල පුනරීක්ෂණයට විවෘත ය. නැතිනම් පාර්ලිමේන්තුවේ අනුමැතියට යටත් ය. කාර්ය සාධන බලකාය ද එම මට්ටමේ වගවීමට යටත් කිරීම අත්‍යවශ්‍ය ය. |

| | | |
|---|---|---|
| | (ඇ) එම පුරාවිද්‍යාත්මක උරුමයන් ආරක්ෂා කිරීම සහ පවත්වා ගැනීම<br><br>47(1) වගන්තිය අනුව ඇමතිවරයාට මෙම ආඥාපනතේ මූලධර්ම හෝ ප්‍රතිපත්ති ඉටු කිරීමේ හෝ බලගැන්වීමේ අරමුණෙන් රෙගුලාසි සකස් කළ හැකිය. | |
| 2. එවැනි හඳුනාගත් ස්ථාන සහ පුරාවස්තූන් සංරක්ෂණය කිරීමෙන් සහ ප්‍රතිස්ථාපනය කිරීමෙන් පුරාවිද්‍යාත්මක උරුමය කළමනාකරණය සඳහා සුදුසු වැඩ සටහනක් හඳුනා ගැනීම සහ ක්‍රියාත්මක කිරීම | 1990 අංක 16 ජාතික වටිනාකමක් ඇති පුරාවිද්‍යාත්මක ස්ථාන පනත.<br><br>2(2) වගන්තිය අනුව ඇමතිවරයාට මෙම පනතේ පළමු උපලේඛනයෙන් විස්තර කර නැති පුරාවිද්‍යාත්මක ක්‍රියාකාරකම්, ස්ථාන සහ නටබුන් හෝ වෙනත් පුරාවස්තූන් ජාතික වැදගත්කමකින් යුත් ලෙස ගැසට් මගින් නිවේදනය කළ හැකිය.<br><br>3(අ)(2) උපවගන්තිය යටතේ කරනු ලබන සෑම නියමයක්ම ගැසට් පත්‍රය ප්‍රකාශයට පත් කළ දින සිටම බලාත්මක අතර (3) උපවගන්තිය යටතේ එම නියෝග අනුමත කිරීමේ යෝජනාවක් සමග පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය. පාර්ලිමේන්තුව එය අනුමත කිරීම ප්‍රතික්ෂේප කරයි නම් එකී නියමයන් යටතේ කරන ලද කිසිවකට අගතියක් නොවන ආකාරයට ප්‍රතික්ෂේප කරන ලද දිනයේ සිට නියෝග අහෝසි වේ. | මෙම කාර්ය සඳහා පවතින නීතියෙන් ප්‍රතිපාදන තිබිය දී කාර්ය සාධන බලකායක් ඇයි ද යන ප්‍රශ්නය ඇසිය හැකිය.<br><br>වැඩි දුරටත් 'පුරාවිද්‍යාත්මක උරුමයන් හඳුනා ගැනිමට' යොදා ගන්නා නිර්ණායක මොනවාද සහ 'සුදුසු වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීමට' ගනු ලබන මූලපිරුම් මොනවාද යන්න පැහැදිලි නැත. |
| 3. එවැනි පුරාවිද්‍යාත්මක ස්ථානවලට වෙන් කළ යුතු ඉඩම් ප්‍රමාණය හඳුනා ගැනීම සහ ඒවා නිසි පරිදි සහ නිත්‍යානුකූලව වෙන් කිරීමට අවශ්‍ය පියවර ගැනීම | 1988 අංක 73 සංස්කෘතික දේපොළ පනත<br><br>7-10 වගන්තිවලින් පුරාවිද්‍යා කොමසාරිස්ට ඔහුගේ බලතල යොදා ගැනිමේ දී හෝ ඔවුන්ගේ මතය ලබා ගැනීමට මණ්ඩලයට යොමු කරන වෙනත් කරුණුවලදී උපදෙස් දීමේ උපදේශක මණ්ඩලයක් සේ ක්‍රියා කිරීමට සංස්කෘති දේපොළ මණ්ඩලයක් පිහිටුවිමට ප්‍රතිපාදන ලබා දේ.<br><br>11 වගන්තිය යටතේ ඇමතිවරයා මණ්ඩලය විමසීමෙන් පසුව සහ කැබිනට් අනුමැතිය ලබා ගැනීමෙන් මෙම පනත යටතේ ලියා පදිංචි කළ යුතු සංස්කෘතික දේපොළ කාණ්ඩ නිශ්චය කරන ගැසට් නිවේදනයක් නිකුත් කරනු ඇත.<br><br>22 වගන්තිය යටතේ පුරාවිද්‍යා කොමසාරිස්ට වෙනත් ඒවා අතර පහත බලතල පැවරේ.<br><br>(අ) මෙම පනත යටතේ ලියා පදිංචි කළ යුතු සංස්කෘතික දේපොළ කාණ්ඩ ලැයිස්තුවක් සකස් කිරීම<br>(ආ) ලියා පදිංචි කිරීමට අවශ්‍ය සංස්කෘතික දේපොළ සංරක්ෂණය, නඩත්තු කිරීම, ප්‍රතිසංස්කරණය සහ ප්‍රතිස්ථාපනය කිරීම සහ පුරාවිද්‍යා කොමසාරිස්ට හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකුට කිසියම් පුද්ගලයෙකු සන්තකයේ ඇති කිසියම් සංස්කෘතික දේපොළක් පරීක්ෂා කළ හැකිය.<br><br>25(1) වගන්තිය යටතේ කිසියම් පුද්ගලයෙකු සතු හෝ භාරයේ හෝ සන්තකයේ ඇති ජාතික වැදගත් කමකින් | ඉඩම් හඳුනා ගන්නේ සහ වෙන් කරන්නේ කෙසේද යන්න සහ ඊට රජයේ සහ/හෝ පුද්ගලික ඉඩම් අයත් වන්නේ ද යන්න පිළිබඳ තොරතුරු සපයා නැත.<br><br>මින් තව තවත් ඉඩම් රජයට අත්පත් කර ගැනීමට හේතු විය හැකිය. ඉඩම් අත්පත් කර ගැනීමක් සිදු වන්නේ නම් එය සංවරණ සහ තුලන ක්‍රමයක් ඇතිව නීතියෙන් දක්වා ඇති ආකාරයට සිදු විය යුතුය. ( ඉඩම් අත්පත් කර ගැනීමේ පනත සහ පුරාවස්තූන් ආඥාපනත වැනි) |

| | | |
|---|---|---|
| | යුත් කිසියම් සංස්කෘතික දේපොළක් විනාශවීමේ අනතුරට ලක්ව ඇතැයි පුරාවිද්‍යා කොමසාරිස් සිතන්නේ නම් මණ්ඩලයේ එකඟතාවය ඇතිව එම දේපොළ ආරක්ෂා කිරීමට එම පුද්ගලයාට නියෝග කළ හැකිය.<br>එවැනි නියෝගයක් පිළිපදින්නේ නැතිනම් ඔහුට මණ්ඩලයේ එකඟතාවය ඇතිව එවැනි දේපොළක් තම භාරයට ගත හැකිය.<br><br>28 වගන්තිය යටතේ ඇමතිවරයාට මෙම පනත යටතේ අවශ්‍ය කරන රෙගුලාසි සකස් කළ හැකිය.<br><br>29 වගන්තිය යටතේ ''සංස්කෘතික දේපොළක්' යන්නට කිසියම් දෙයක් ආගමික හෝ ආගමික නොවන හේතූන් මත ඇතුළත් විය හැකිය. එවැන්නක් ඇමතිවරයාට කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ඇතිව පුරාවිද්‍යා, පූර්ව ඓතිහාසික, ඓතිහාසික, සාහිත්‍ය, කලා හෝ විද්‍යාවට වැදගත්යැයි නම් කළ හැකිය. | |
| 4. පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථානවල සංස්කෘතික අගය සුරැකීම සහ දේශීය වශයෙන් සහ අන්තර්ජාතිකව ශ්‍රී ලංකාවේ සුවිශේෂත්වය ප්‍රවර්ධනය කිරීම සහ එවැනි උරුමයන් ප්‍රවර්ධනය සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම | 1980 අංක 57 මධ්‍යම සංස්කෘතික අරමුදල පනත<br><br>2 සහ 3 වගන්ති අනුව මධ්‍යම සංස්කෘතික අරමුදලක් පිහිටුවීමට සහ පනතෙන් දක්වා ඇති ආකාරයට පාලක මණ්ඩලයට අරමුදලේ පරිපාලනය, කළමනාකරණය සහ පාලනය පැවරීම<br><br>1979 අංක 7 රජයේ ඉඩම් ( සන්තකය ආපසු ලබා ගැනීම) පනත<br>මෙම පනතින් රජයේ ඉඩම් අනවසරයෙන් සන්තකයට ගෙන ඇති හෝ අත්පත් කර ගෙන ඇති පුද්ගලයන්ගෙන් සන්තකය ආපසු ගැනීමට සහ අදාල වෙනත් කරුණු පිළිබඳව ප්‍රතිපාදන සපයයි.<br><br>ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක උරුමය කළමනාකරණය සඳහා වූ ඉහළම ආයතනය සහ ප්‍රධාන නියාමන මණ්ඩලය වේ. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට ශ්‍රී ලංකාවේ සම්පූර්ණ පුරාවිද්‍යා උරුමය ආරක්ෂා කිරීමට, එනම් ස්ථාන, ස්මාරක සහ චංචල පුරාවස්තු ඇතුළත් ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා උරුමය ඉන්වෙන්ටරි ගත කිරීම සහ සංරක්ෂණය පැවරේ.<br><br>පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නීති අංශයට පුරාවස්තූන් ආරක්ෂා කිරීමට, පුරාවස්තු ආඥාපනත සහ ආනුෂංගික වෙනත් පනත් යොදා ගැනීමට නීතිමය පියවර ගැනීම සහ උසාවි හරහා එවැනි ප්‍රතිපාදන උල්ලංඝනය කරන පුද්ගලයන්ට දඬුවම් ලබාදීම පැවරේ. ඊට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ වැඩ කටයුතු පොලිස් දෙපාර්තමේන්තුව සහ නීතිපති දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණය ද ඇතුළත් වේ. | පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථානවල සංස්කෘතික අගය සුරැකීමේ කාර්ය සිදු කරන්නේ කෙසේද යන්න පිළිබඳ තොරතුරු ලබා දී නොමැත.<br><br>කාර්ය සාධන බලකාය නිර්දේශ ඉදිරිපත් කරන්නේ කාටද යන්න නොදනී. |

## 5. නිගමනය

ජනාධිපති රාජපක්ෂ මහතා සිය 2019 ඡන්ද ව්‍යාපාරයේ දී විනය ගරුක, සුරක්ෂිත සහ ශක්තිමත් ශ්‍රී ලංකාවක් බිහි කිරීම සඳහා පොරොන්දු වූවේය. මෙම පොරොන්දු ඉටු කිරීමට සුළු හෝ කිසිම විරෝධතාවයක් මතුවන්නේ නැතිව දැඩි අධිෂ්ඨානයෙන් සහ බලයෙන් යුතුව ඔහු තෝරා ගත් මාර්ගය, ඔහුගේම කැබිනට් මණ්ඩලය ඇතුළුව පවතින නීතිමය ව්‍යුහයන් ඉක්මවා යන බව මැතක් වූ සිදුවීම්වලින් පෙනේ. මෙම පත්‍රිකාවේ සාකච්ඡා කළ ආකාරයට ඔහු තම දැක්ම ක්‍රියාත්මක කිරීම ආරම්භයක් සඳහා පුළුල් බලතල සහිත තත් කාර්ය සාධන බලකා යොදා ගැනීමේ මාර්ගය තෝරා ගෙන ඇති අතර එම ක්‍රියාවලියේ දී ආයතනවලට නීතියෙන් ලබා දී ඇති බලතල යටපත් කිරීම හෝ පැහැර ගැනීම සිදුවිය හැකිය. වැඩි දුරටත් එක් එක් කාර්ය සාධන බලකායේ මුල් තැනට ඔහුට සමීප නිලධාරීන් පත් කිරීමෙන් සියල්ලට වඩා පක්ෂපාතී භාවය වැදගත් කොට සලකන බවත් දැනට සේවයේ සිටින සහ විශ්‍රාමික හමුදා සහ නීතිය හා සාමය අංශවල නිලධාරීන්ගෙන් හා තවත් කීප දෙනෙකුගෙන් ඒවා පුරවන බවත් පෙනේ. කොවිඩ්- 19 මර්දනය කිරීමේ දි ආණ්ඩුව සහ පාලනය හමුදාකරණය සහ ආරක්ෂක හමුදාවට යටත් කිරීම දැන් තේරී පත් වූ ව්‍යවස්ථාදායකයක් නැති තත්වයක් තුළ තහවුරු වෙමින් පවතී. මෙය හඳුන්වාදීමේ කඩිනම හා කාර්යක්ෂමතාවය ගැන ආණ්ඩුවේ ඇති උනන්දුව පැහැදිලි ය. මෙය සිදු වන්නේ පාර්ලිමේන්තුවක් නොමැතිව සහ බලවත් සංවරණ සහ තුලන ක්‍රමයක් නොමැතිවවිම කැපී පෙනෙන කාරණයකි. පාලනයට ලක් නොවුහොත් මෙවැනි විධායක බල ව්‍යාප්තිය නිදහස් සහ විවෘත සමාජයක් කෙරේ හිරිවැටෙන බලපෑමක් ඇති කරන අතර ඒකාධිකාරී සහ හමුදාකරණය වූ රාජ්‍යයකින් පාලනය වන, වාර්ගික ජාතිකවාදයෙන් නිර්වචනය වන රාජ්‍යයක් කරා පරිණාමය වනු ඇත.